**සූරියවැව ප්‍රාදේශීය සභාව - 2021**

**-----------------------------------------**

## 1. මූල්‍ය ප්‍රකාශන

**---------------**

### 1.1. තත්ත්වාගණනය කළ මතය

**-------------------------------**

සූරියවැව ප්‍රාදේශීය සභාවේ 2021 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්වය පිළිබඳ ප්‍රකාශනය, එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය මෙහෙයුම් පිළිබඳ ප්‍රකාශනය, ශුද්ධ වත්කම් වෙනස්වීමේ ප්‍රකාශනය, මුදල් ප්‍රවාහ ප්‍රකාශනය වැදගත් ගිණුම්කරණ ප්‍රතිපත්ති සහ අනෙකුත් පැහැදිලි කිරීමේ තොරතුරුවල සාරාංශයකින් සමන්විත 2021 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන 1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 172 (1) උපවගන්තිය සහ 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ විධිවිධාන සමඟ සංයෝජිතව කියවිය යුතු ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154 (1) ව්‍යවස්ථාවේ ඇතුළත් විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කළ යුතු යැයි මා අදහස් කරන මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් මෙම වාර්තාවේ දැක්වේ.

මෙම වාර්තාවේ 1.6 ඡේදයේ දක්වා ඇති කරුණුවලින් වන බලපෑම හැර, මූල්‍ය ප්‍රකාශනවලින් 2021 දෙසැම්බර් 31 දිනට සූරියවැව ප්‍රාදේශීය සභාවේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරීත්වය හා මුදල් ප්‍රවාහ පොදුවේ පිළිගත් ගිණුම්කරණ පරිචයන්ට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

### 1.2. තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම

**-------------------------------------------**

මෙම වාර්තාවේ 1.6 ඡේදයේ දක්වා ඇති කරුණු මත පදනම්ව මා මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් තත්ත්වාගණනය කළ මතයක් පළ කරනු ලැබේ.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට (ශ්‍රී.ලං.වි.ප්‍ර.) අනුකූලව මා විගණනය සිදු කරන ලදී. මෙම විගණන ප්‍රමිති යටතේ වූ මාගේ වගකීම, මෙම වාර්තාවේ මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම යන කොටසේ තවදුරටත් විස්තර කර ඇත. මාගේ තත්ත්වාගණනය කළ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබාගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

### 1.3. මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් කළමනාකරණයේ සහ ඊට සම්බන්ධ පාලනය කරන පාර්ශවයන්ගේ වගකීම්

**---------------------------------------------------------------------------------------------------------**

මෙම මූල්‍ය ප්‍රකාශන පොදුවේ පිළිගත් ගිණුම්කරණ පරිචයන්ට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර වූ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවනු පිණිස අවශ්‍ය වන අභ්‍යන්තර පාලනය තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.
ප්‍රාදේශීය සභාවේ මූල්‍ය වාර්තාකරණ ක්‍රියාවලිය සම්බන්ධ වගකීම්, පාලනය කරන පාර්ශවයන් විසින් දරනු ලබයි.
2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 16 (1) උප වගන්තිය ප්‍රකාරව ප්‍රාදේශීය සභාවේ වාර්ෂික හා කාලීන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවන පරිදි ස්වකීය ආදායම්, වියදම්, වත්කම් හා බැරකම් පිළිබඳ නිසි පරිදි පොත්පත් හා වාර්තා පවත්වාගෙන යා යුතුය.

## 1.4. විගණන විෂය පථය (මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම)

-----------------------------------------------------------------------------------------------

සමස්ථයක් ලෙස මූල්‍ය ප්‍රකාශන, වංචා සහ වැරදි නිසා ඇතිවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබාදීම සහ මාගේ මතය ඇතුළත් විගණන වාර්තාව නිකුත් කිරීම මාගේ අරමුණ වේ. සාධාරණ සහතිකවීම උසස් මට්ටමේ සහතිකවීමක් වන නමුත්, ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය සිදු කිරීමේදී එය සැමවිටම ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් අනාවරණය කරගන්නා බවට වන තහවුරු කිරීමක් නොවනු ඇත. වංචා සහ වැරදි තනි හෝ සාමූහික ලෙස බලපෑම නිසා ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇති විය හැකි අතර, එහි ප්‍රමාණාත්මකභාවය මෙම මූල්‍ය ප්‍රකාශන පදනම් කරගනිමින් පරිශීලකයන් විසින් ගනු ලබන ආර්ථික තීරණ කෙරෙහි වන බලපෑම මත රඳා පවතී.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනයේ කොටසක් ලෙස මා විසින් විගණනයේදී වෘත්තීය විනිශ්චය සහ වෘත්තීය සැකමුසුබවින් යුතුව ක්‍රියා කරන ලදී. මා විසින් තවදුරටත්,

- ප්‍රකාශ කරන ලද විගණන මතයට පදනමක් සපයා ගැනීමේදී වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇතිවීමේ අවදානම් හඳුනාගැනීම හා තක්සේරු කිරීම සඳහා අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කර ක්‍රියාත්මක කරන ලදී. වරදවා දැක්වීම හේතුවෙන් සිදුවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් සිදුවන බලපෑමට වඩා වංචාවකින් සිදුවන්නා වූ බලපෑම ප්‍රබල වන්නේ ඒවා දූස්සන්ධානයෙන්, ව්‍යාජ ලේඛන සැකසීමෙන්, චේතනාන්විත මඟහැරීමෙන්, වරදවා දැක්වීමෙන් හෝ අභ්‍යන්තර පාලනයන් මඟහැරීමෙන් වැනි හේතු නිසා වන බැවිනි.
- අභ්‍යන්තර පාලනයේ සඵලදායීත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමේ අදහසින් නොවුවද, අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස අභ්‍යන්තර පාලනය පිළිබඳව අවබෝධයක් ලබාගන්නා ලදී.

- භාවිතා කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල උචිතභාවය, ගිණුම්කරණ ඇස්තමේන්තුවල සාධාරණත්වය සහ කළමනාකරණය විසින් කරන ලද සම්බන්ධිත හෙළිදරව් කිරීම් අගයන ලදී.

- මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය හා අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණව ඇතුළත් වී ඇති බව සහ හෙළිදරව් කිරීම් ඇතුලත් මූල්‍ය ප්‍රකාශනවල සමස්ථ ඉදිරිපත් කිරීම අගයන ලදී.

  හැකිතාක් දුරට හා අවශ්‍ය ඕනෑම විටෙක පහත සඳහන් දෑ පරීක්ෂා කිරීම සඳහා විගණන විෂය පථයද පුළුල් කර ඇත.

- තොරතුරු ඉදිරිපත් කිරීම සම්බන්ධයෙන් බලන කල ප්‍රාදේශීය සභාවේ කාර්යයන් අඛණ්ඩව ඇගයීමට හැකිවන පරිදි එහි සංවිධානය, පද්ධති, පරිපාටි, පොත්පත්, වාර්තා හා වෙනත් ලියකියවිලි විධිමත්ව හා ප්‍රමාණාත්මකව සැලසුම් කර තිබේද යන බව සහ එකී පද්ධති, පරිපාටි, පොත්පත්, වාර්තා හා වෙනත් ලියකියවිලි ඵලදායී ලෙස පවත්වාගෙන යනු ලැබේ ද යන බව;

- අදාළ ලිඛිත නීතියකට හෝ ප්‍රාදේශීය සභාව විසින් නිකුත් කරන ලද වෙනත් පොදු හෝ විශේෂ විධානයකට අනුකූලව, ප්‍රාදේශිය සභාව ක්‍රියාකර ඇති බව,

- සිය බලතල, කර්තව්‍ය සහ කාර්යයන්ට අනුකූලව කටයුතු කර ඇති බව,

- සම්පත් සකසුරුවම් ලෙස, කාර්යක්ෂම ලෙස සහ ඵලදායී ලෙස කාලසීමාවන් තුළ සහ අදාළ නීතිරීතිවලට අනුකූලව ප්‍රසම්පාදනය කර භාවිතා කර ඇති බව.

## 1.5 වෙනත් නෛතික අවශ්‍යතා පිළිබඳ වාර්තාව

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ පහත සඳහන් අවශ්‍යතාවයන් සම්බන්ධයෙන් විශේෂ ප්‍රතිපාදන ඇතුළත්වේ.

(අ) 2018 අංක 19 දරණ ජාතික විගණන පනතේ 6(1) (ඈ) (iii) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව ප්‍රාදේශීය සභාවේ මූල්‍ය ප්‍රකාශන ඉකුත් වර්ෂය සමඟ අනුරූප වේ.

(ආ) 2018 අංක 19 දරණ ජාතික විගණන පනතේ 6(1) (ඈ) (iv) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව ඉකුත් වර්ෂයේදී මා විසින් සිදු කරන ලද නිර්දේශයන් ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශනවල ඇතුළත්ව ඇත.

## 1.6 මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීම සම්බන්ධයෙන් වූ විගණන නිරීක්ෂණ

### 1.6.1 ගිණුම්කරණ අඩුපාඩු

| | විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | සමාලෝචිත වර්ෂයේදී වැඩ නිම කළ ඉදිකිරීමේ ව්‍යාපෘති 06 කට අදාළව ප්‍රාග්ධනිත කළ යුතු වටිනාකම රු. 13,670,989 ක් අඩුවෙන් ගිණුම්ගත කර තිබුණි. | ඉදිරි වර්ෂයේ මූල්‍ය ප්‍රකාශන සකස් කිරීමේදී නිවැරදි කරමි. | ප්‍රාග්ධන වියදම් නිවැරදිව ගිණුම්ගත කළ යුතුය. |
| (ආ) | සභාවට පරිබාහිරව සේවකයන් නමින් බැංකු ගිණුම් වල තැන්පත් කර ඇති සේවක ඇප තැන්පත් රු. 1,331,547 ක් එක් එක් නිලධාරීන්ගේ වත්කමක් වුයෙන් සභාව විසින් ගෙවියයුතු වගකීමක් හා ආයෝජන ලෙස ගිණුම්ගත කිරීම නිසා ජංගම වත්කම් හා වගකීම් එම වටිනාකමින් වැඩියෙන් දැක්වුණි. | ඉදිරි වර්ෂයේ මූල්‍ය ප්‍රකාශන සකස් කිරීමේදී මෙවැනි දෝෂ සිදු නොවන පරිදි කටයුතු කරමි. | ජංගම වත්කම් හා වගකීම් නිවැරදිව ගිණුම්ගත කළ යුතුය. |
| (ඇ) | පළාත් ආදායම් දෙපාර්තමේන්තුව දන්වා එවන ලද, ආදායම් වශයෙන් සභාවට ලබානොදෙන බවට නිශ්චිතව දන්වා තිබියදි සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට ඉකුත් වර්ෂයන්ට අදාළ රු. 895,622 ක් ලැබිය යුතු උසාවි දඩ ශේෂයක් ලෙස ගිණුම්ගත කර තිබීම නිසා ජංගම වත්කම් එම වටිනාකමින් වැඩියෙන් දැක්වුණි . | ඉදිරි වර්ෂයේ මූල්‍ය ප්‍රකාශන සකස් කිරීමේදී නිවැරදි කරමි. | ජංගම වත්කම් නිවැරදිව ගිණුම්ගත කළ යුතුය . |
| (ඈ) | සභාවට අයත් කැබ් රථයක් විකිණීමෙන් ලද රු. 835,000 ක ආදායම ප්‍රාග්ධන වත්කම් විකුණුම් යටතේ ගිණුම්ගත නොකර ප්‍රාග්ධන ආධාර ආදායම් ලැබීමක් ලෙස ගිණුම්ගත කර තිබුණි. | ඉදිරි වර්ෂවල මූල්‍ය ප්‍රකාශන සකස් කිරීමේදී මෙවැනි දෝෂයක් සිදු නොවන පරිදි කටයුතු කරමි. | ආදායම් නිවැරදිව ගිණුම්ගත කළ යුතුය . |

| | | |
|---|---|---|
| (ඉ) සමාලෝචිත වර්ෂය තුළ දේශීය ණය සංවර්ධන අරමුදලට ගෙවන ලද රු. 2,200,309 ක ණය වාරික හා රු. 15,385 ක පොළී ගෙවීම් මූල්‍ය ක්‍රියාකාරකම් යටතේ නොදක්වා ආයෝජන ක්‍රියාකාරකම් යටතේ දක්වා තිබුණි.<br>(ඊ) සමාලෝචිත වර්ෂය සඳහා ස්ථිර තැන්පත් හා ඉතිරි කිරීම් ගිණුම් සඳහා ලද පොළිය රු. 572,912 ක් වුවත් එය රු. 499,133 ක් ලෙස දැක්වූයෙන් රු.73,779 ක් අඩුවෙන් ආයෝජන ක්‍රියාකාරකම් යටතේ දක්වා තිබුණි. | ඉදිරියේදී මුදල් ප්‍රවාහ ප්‍රකාශය නිවැරදිව සකස් කිරීමට කටයුතු කරමි. | මුදල් ප්‍රවාහ ප්‍රකාශනය නිවැරදිව පිළියෙල කළ යුතුය. |
| (උ) වමල් රාජපක්ෂ ළමා උද්‍යානයේ පැරණි උපකරණ ගලවා ඉවත් කිරීමේ කර්මාන්තයට අදාළව ලැබිය යුතු ප්‍රාග්ධන ආධාර රු. 3,161,592 ක් වුවත් එය රු. 2,736,400 ක් ලෙස දැක්වූයෙන් ලැබියයුතු ප්‍රාග්ධන ආධාර රු. 425,192 ක් අඩුවෙන් දැක්වුණි. | ඉදිරි වර්ෂවල මූල්‍ය ප්‍රකාශන සකස් කිරීමේදී නිවැරදි කරමි. | ලැබිය යුතු ප්‍රාග්ධන ආධාර නිවැරදිව ගිණුම්ගත කළ යුතුය. |
| (ඌ) සමාලෝචිත වර්ෂයේදී සුසාන භූමි 05 ක මායිම් වැටවල් නඩත්තු කිරීම සඳහා වැයකළ රු. 275,735 ක් ප්‍රාග්ධනිත කර තිබුණි. | | අයහාර වියදම් නිවැරදිව ගිණුම්ගත කළ යුතුය. |
| (එ) සමාලෝචිත වර්ෂය තුළ ක්‍රියාත්මක කළ ව්‍යාපෘති 03 කට අදාළව ණයහිමි ප්‍රතිපාදන වෙන් කිරීම රු. 233,519 ක් වැඩියෙන් ගිණුම්ගත කර තිබුණි. | | ණයහිමි ප්‍රතිපාදන වෙන් කිරීම නිවැරදිව කළ යුතුය. |

## 2. මූල්‍ය සමාලෝචනය

---------------------

### 2.1 මූල්‍ය ප්‍රතිඵල

--------------

ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන අනුව සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා සභාවේ පුනරාවර්තන වියදම ඉක්ම වූ ආදායම රු. 17,815,568 ක් වූ අතර, ඊට අනුරූපීව ඉකුත් වර්ෂයේ පුනරාවර්තන වියදම ඉක්ම වූ ආදායම රු. 21,130,642 ක් විය.

## 2.2 ආදායම් පරිපාලනය

### 2.2.1 ආදායම් රැස් කිරීමේ කාර්යසාධනය

| | විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | **කුලී** | | |
| i. | සමාලෝචිත වර්ෂය සඳහා කඩකාමර 60 කින් ලැබිය යුතු කඩ කුලී රු. 941,485 ක් අයකර ගැනීමට කටයුතු කර නොතිබුණි. | හිඟ කඩ කුලියෙන් රු.379,990 ක් කපා හැරීම සඳහා ආණ්ඩුකාරවරයාගේ අනුමැතියට ඉදිරිපත්කළ බවත් ඉතිරි හිඟ අයකර ගැනීමට කටයුතු කරමි. | හිඟ ආදායම් කඩිනමින් අයකර ගත යුතුය. |
| ii. | සමාලෝචිත වර්ෂය සඳහා බදු දේපල 11 කින් ලැබිය යුතු රු. 5,087,902 ක් අයකර ගැනීමට කටයුතු කර නොතිබූ අතර හිඟ ශේෂය තුළ 2018 වර්ෂයට අදාළව සූරියවැව සතිපොළ රථගාලින් ලැබිය යුතු රු. 23,415 ක් පැවතුණි. | රු. 3,366,428 ක් කපාහැරීම සඳහා ආණ්ඩුකාරවරයා වෙත ඉදිරිපත් කළ බවත්, රු. 23,415 ක් අයකර ගැනීම සඳහා සමථ මණ්ඩලයට සහ ඉතිරිය බදුකරුවන්ගේ ආරක්ෂිත ඇප මුදලින් හිලව් කිරීමට කටයුතු කරමි. | හිඟ ආදායම් කඩිනමින් අයකර ගත යුතුය. |
| iii. | සභාව සතු යන්ත්‍රෝපකරණ 2020 හා 2021 වර්ෂයන් වලදී භාහිර පුද්ගලයන්ට කුලියට දීම මත ලැබිය යුතු රු. 485,500 ක් අයකර ගැනීමට සමාලෝචිත වර්ෂයේ අවසානය වන විටත් කටයුතු කර නොතිබුණි. | හිඟ මුදල් කඩිනමින් ලබා දෙන ලෙස ඉල්ලා ලිපි යොමු කළෙමි. | හිඟ ආදායම් කඩිනමින් අයකර ගත යුතුය. |
| (ආ) | **බලපත්‍ර ගාස්තු** | | |
| | සමාලෝචිත වර්ෂය සඳහා දැන්වීම් පුවරු 53 කින් ලැබිය යුතු රු. 1,352,675 ක දැන්වීම් පුවරු ගාස්තු අයකර ගැනීමට කටයුතු කර නොතිබුණි. | රු. 8,375 ක් අයකර ගැනීම සඳහා සමථ මණ්ඩලය වෙත ඉදිරිපත් කළ බවත්, ඉතිරි හිඟ අයකර ගැනීමට කටයුතු කරමි. | හිඟ ආදායම් කඩිනමින් අයකර ගත යුතුය. |

## 3. මෙහෙයුම් සමාලෝචනය

ප්‍රාදේශීය සභා පනතේ 3 වන වගන්තිය යටතේ මහජන සෞඛ්‍ය, පොදු උපයෝගීතා සේවා සහ පොදු මංමාවත් පිළිබඳ කාරණා විධිමත් කිරීම හා පාලනය කිරීම, ජනතාවගේ සුබ විහරණය, පහසුව හා සුභසාධනය යන සභාව විසින් ඉටුකළ යුතුව තිබුණු කර්තව්‍යයන් ඉටුකිරීම පිළිබඳව නිරීක්ෂණය වූ කරුණු පහත දැක්වේ.

**3.1 කළමනාකරණ අකාර්යක්ෂමතා**

| විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
| --- | --- | --- |
| 2015,2018,2019 හා 2020 වර්ෂයන් වලදී ඉදිකර තිබු පිළිවෙලින් ඒකක 02, 06, 01 ක් හා 13 ක් ලෙස එකතුව ඒකක 22 ක් වූ අනවසර ඉදිකිරීම් සම්බන්ධයෙන් ප්‍රාදේශීය සභා පනතේ 52 වගන්තිය ප්‍රකාරව සභා කළමනාකාරීත්වය කටයුතු කර නොතිබුණි. | ඉදිරියේදී අනවසර ඉදිකිරීම් වැළැක්වීමටත් ජනතාව මේ පිළිබඳ දැනුවත් කර ඉදිකිරීම් නියමානුකූල කිරීමට කටයුතු කරමි. | පනත ප්‍රකාරව කටයුතු කළ යුතුය. |